අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : අංක 20

මගේ අංකය : ජේඑ්එ්/විවිධ
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 12.
1979 සැප්තැම්බර් මස 04 දින.

සියළුම දිසා විනිශ්චයකාරවරුන් හා
මහේස්ත්‍රාත්වරුන් වෙත.

<u>අසා නිම නොවූ නඩු.</u>

මීට පෙර සේවය කරන ලද අධිකරණයන්හි අසා නිම නොවූ නඩු අවසන් කිරීම පිණිස විනිශ්චයකාරවරුන් එම අධිකරණයන්ට යාමේදී ඒ වෙනුවෙන් දැරිය යුතු ගමන් වියදම් අඩු කිරීම සඳහා පියවර ගන්නා මෙන් අධි/ලේ විසින් කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

මෙම කරුණ සලකා බැලූ කොමිෂන් සභාව එවැනි නඩු විභාග සඳහා හැකිතාක් දුරට <u>අනුගාමී දිනයක් යොදා ගත යුතු බැව්</u> ඔබට දැනුම් දෙන මෙන් මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්